**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස !!!**

# ධම්මපදය

## චිත්ත වර්ගය (03-04 ගාථා)

**3. ගාථාව**

**දුන්නිග්ගහස්ස ලහුනෝ - යත්ථ කාමනිපාතිනෝ,**
**චිත්තස්ස දමථෝ සාධු - චිත්තං දන්තං සුඛාවහං.**

**පදගතාර්ථය**

| | |
|---|---|
| **දුන්නිග්ගහස්ස** | - නිග්‍රහකොට හික්මවාලිය නො හැකි, |
| **ලහුනෝ** | - වහා ඉපිද නැසෙනසුලු වූ, |
| **චිත්තස්ස** | - චිත්තයාගේ, |
| **දමථෝ** | - දමනය කිරීම, |
| **සාධු** | - මැනවි, |
| **චිත්තං** | - සිත, |
| **දන්තං** | - දමනය කරන ලද්දේ, |
| **සුඛාවහං** | - (ලොවුතුරු) සැප ගෙන දෙන්නේ ය. |

**භාවාර්ථය**

වහා ඉපිද වහා නැසෙන්නා වූ ද, යුතු අයුතුකම් නො සලකා ඒ ඒ තැන වැටෙන්නා වූ ද, සිත දමනය කිරීම මැනවි. දමුනු සිත සුව එළවයි.

**නිදන කථාව**

කොසොල් රජුට අයත් දනව්වක කන්දක් පාමුල ඇලගමු නම් ගමක් විය. එහි බොහෝ මනුෂ්‍යයෝ වූහ. එහි 'මාතික' නම් ගම් පෙදෙසක් විය. එගම අධිපතියා ද එනමින් ප්‍රසිද්ධ විය. ඔහුගේ මව් මාතික මාතා නමින් ප්‍රසිද්ධ ය. ඕ තොමෝ නිතර භික්ෂූන් වහන්සේ සිය ගෙට වැඩම කරවා දන් දෙන්නී ය.

එකල බුදුරජාණන් වහන්සේ වෙතින් කමටහන් උගත් භික්ෂූන් වහන්සේලා සැටනමක් ඒ ගමට වැඩ මාතික මාතාවගේ ආරාධනයෙන් එහි වස් විසූහ. දිනක් පන්සලට ගිය මාතික මාතාවට එක භික්ෂුවක් හෝ දකිය නො හැකි විය. භික්ෂූන් වහන්සේලා ඔවුනොවුන් කතිකා කර ගෙන වෙන වෙන කුටිවල භාවනා කරමින් වැඩවිසූහ. ඒ බව එහි සිටි කැපකරුගෙන් දැන ගෙන භික්ෂූන් වහන්සේලා වැඩම කරවා ගැනීම පිණිස ගෙඩිය නාද කෙරෙව්වා ය. ගෙඩි හඬ ඇසූ භික්ෂූන් වහන්සේලා එක එක තැනින් අවුත් උපස්ථාන ශාලාවෙහි රැස් වූහ.

උපාසිකා තොමෝ තනි තනි ව වැඩි භික්ෂූන් දැක "අසමගියක් ද" යි අසා, "නැත, අපි තනි තනි ව සිට මහණදම් පුරන්නෙමු"යි කියා භික්ෂූන් වහන්සේලා පැවසූ කල්හි උපාසිකා තොමෝ "මහණදම් නම් කිමෙක් ද"යි අසා දැන, භාවනා ක්‍රම අසා දැන ගෙන ඕ තොමෝ ද ද්වත්තිංසාකාරය වඩා ඒ භික්ෂූන්ට පෙරාතු ව අනාගාමී ඵලය දක්වා මාර්ග-ඵල සුව ලත්හ. පසු ව ඇය එම භික්ෂූන් වහන්සේලා මාර්ග-ඵල සුවයෙන් පිරිහී ඇති බව දැන සිවු පසයෙන් මනා ව උපස්ථාන කොට රහත් ඵල ලැබීම දක්වා උපස්ථාන කළා ය.

පසු ව එම භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේ හමුවට පැමිණ තමනට වැඩ සැලසූ උවැසියගේ ගුණ කථනය කළහ. එහි සිටි එක්තරා භික්ෂුවක් ඈ පිළිබඳ ව ගුණකථාව අසා එහි යනු කැමති ව බුදුරජාණන් වහන්සේගෙන් කමටහන් ගෙන එහි ගොස් උවැසියගෙන් සෑම උපස්ථානයක් ම ලැබුවේ ය. උපාසිකාව ද එම භික්ෂුව සිතූ සිතූ දෙය සැලසුවා ය. උවැසිය පරසිත් දන්නා කෙනෙකි. එහෙයින් ඒ භික්ෂුව එහි සිටීමට බිය වී පසු ව නැවත බුදුරජාණන් වහන්සේ වෙත ගියේ ය. බුදුරජාණන් වහන්සේ තොරතුරු විචාරා නැවත එහි යන්නැ'යි වදාළ සේක. එම භික්ෂුව පසු ව එහි ගොස් සිත දමනය කොට රහත් බවට පත් විය. තමාට කළ උපකාරයට හේතු වූ අතීත ආත්මභාව සලකනුයේ එක ආත්මභාවයක දී තමා වෙනුවෙන් දිවි දුන් බව ද දැක තුටු ව ඇයට නිර්වාණාවබෝධයට කරුණු දක්වා නිවන් අවබෝධ කරවා පිරිනිවන් පෑ සේක.

**4. ගාථාව**

**සුදුද්දසං සුනිපුණං - යත්ථ කාමනිපාතිනං,**
**චිත්තං රක්ඛේථ මේධාවී - චිත්තං ගුත්තං සුඛාවහං.**

**පදගතාර්ථය**

| | |
|---|---|
| **සුදුද්දසං** | - පැහැදිලි ව දැකීමට ඉතාමත් අපහසු වූ, |
| **සුනිපුණං** | - ඉතා සියුම් වූ, |
| **යත්ථ කාමනිපාතිනං** | - කැමති යම් අරමුණක වැටෙනසුලු වූ, |
| **චිත්තං** | - සිත, |
| **මේධාවී** | - නුවණැත්තේ, |
| **රක්ඛේථ** | - රක්නේ ය (රැකිය යුතු), |
| **ගුත්තං චිත්තං** | - රක්නා ලද සිත, |
| **සුඛාවහං** | - (ලොවුතුරු) සුව එළවන්නේ ය. |

**භාවාර්ථය**

බුද්ධිමතා දැකීමට ඉතා අමාරු වූ, ඉතා සියුම් වූ, කැමති කැමති අරමුණක වැටෙන්නා වූ සිත රක්නේ ය. රක්නා ලද සිත සුව එළවන්නේ ය.

**නිදන කථාව**

බුදුන් දවස සැවැත් නුවර එක්තරා සිටුපුත්‍රයෙක් වාසය කළේ ය. නිරන්තරයෙන් සිටු මැදුරට වැඩ ඔවුන්ට ඔවදන් දෙන හිතවත් තෙරුන් වහන්සේ නමක් ද වූහ. එම තෙරුන්වහන්සේව ඇසුරු කිරීමේ හේතුවෙන් ඒ සිටු කුමරුගේ සැදැහැ සිත බොහෝ දියුණු වූයේ ය. සිටු කුමරු සසර දුක ගැන සලකා කලකිරුණු සිත් ඇත්තේ ඒ දුක කෙළවර කර ගැනීමට සිතී ය. එයට තමන් ඇසුරු කරන කුලුපග තෙරුන්ගෙන් උපදෙස් පැතී ය. තෙරණුවෝ ද ඔහුගේ සිතෙහි කසට මැඩීම සඳහාත් පිළිවෙත්හි පිහිටුවීම සඳහාත් සුදුසු අවවාද දුන්හ.

කුලුපග තෙරුන්ගේ අවවාද හිස් මුදුනින් පිළිගත් සිටුපුත් තෙමේ සඞ්ඝයාට නිබඳ ව දන් දීමාදියෙන් සලාක බත්, අඩමස් බත්, වස් විසූ කල දෙන බත්, ආදි ඒ ඒ කලට සුදුසු වතාවත් නො කඩවා කරමින් සිවුරු පිරිකර පූජා කිරීම් ආදි සිවුපසයෙන් උවටැන් කළේ ය. නිති පන්සිල්, පොහොය අටසිල්, ගෘහස්ථ දසසිල් ආදියෙහි ද පිහිටියේ ය. තෙරුන් වහන්සේගේ ඔවදන් පරිදි මේ සියල්ල මනා ව පිළිපදිමින් තවත් කළ යුතු දේ වෙතොත් එය ද වදාළ මැනවැ'යි අයැද සිටි කල්හි, තෙරණුවෝ එසේ නම් පැවිදි වන්නැ'යි කියා කුමරුට පැවසූහ. කම්සැපෙහි නිසරු කම ගැන කලකිරී සිටි ඔහුට ඒ වචන බොහෝ සතුටට හේතු වූයෙන් අනතුරු ව පැවිදි බවට පත් විය.

ඒ සිටු කුමරුන්ගේ පැවිදි ගුරුවරුන් අතර එක භික්ෂුවක් අභිධර්මය උගත් භික්ෂුවකි. අනෙක් භික්ෂුව විනයධර හිමි නමකි. ආභිධම්මික භික්ෂුව ඔහුට අභිධර්මය උගන්වයි. විනයධර භික්ෂුව 'මේ සසුනෙහි මේ දේ කළ යුතු ය, මේ දේ නො කළ යුතු ය, මෙය කැප ය, මෙය අකැප ය' යි ආදි වශයෙන් විනය උගන්වයි. මෙසේ ඉගෙන ගන්නා ඒ භික්ෂුවට 'පැවිදි ජීවිතය නම් ඉතා දුෂ්කර දෙයකි. මෙහි අත දිගු කිරීමට තරම්වත් නිදහසක් නැත. එනිසා ගිහි ව කටයුතු කරන්නෙමි'යි සිතා උකටලී ව ඉගෙනීම්, වත්පිළිවෙත් කිරීම් ආදිය අතපසු කරමින් වසයි. ඔහු සිතට වසඟ ව කටයුතු කරන බව දුටු ගුරු හිමිවරු එම භික්ෂුව බුදුරජුන් වෙත පැමිණවූහ. එහි දී බුදුරජාණන් වහන්සේ තොරතුරු විචාරා සිත දමනය කිරීමේ අනුසස් වදාරා දහම් දෙසූ සේක. දේශනාව කෙළවර ඒ භික්ෂු තෙමේ සෝවාන් ඵලයෙහි පිහිටියේ ය.

සාධු ! සාධු !! සාධු !!!

**සම්පාදක:** පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානයෙහි ප්‍රධාන අනුශාසක අතිගරු පූජනීය මීතලාවේ විනීත ස්වාමීන් වහන්සේ

ශ්‍රී සද්ධර්ම සංසදය
ධම්මාරාම යෝගාශ්‍රමය
(වෙසක් 2551)

**පිටු සැකසීම:** පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත උපාසක මහතා.

**ධර්මදානය:** පින්වත් දයාසීලී උපාසිකා මාතාව හා උපේක්ෂා පියරංගිකා මෙනෙවිය විසින් අභාවප්‍රාප්ත ඥාතීන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිසත් තමන්ට ධර්මාවබෝධය පිණිසත් මෙම ධර්මදානය සිදු කරන ලදී.

❖ *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්දුයන් වහන්සේගේ ධර්ම දේශනා ඇතුළු පටිගත කරන ලද ධර්ම දේශනා සහ පසුගිය දහම් ලිපි* **www.sadaham.net** *යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.*

**Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2007**